නාවික හා සාගරික විද්‍යාපීඨය
නාවික කඳවුර
ත්‍රිකුණාමලය

එන්එම්ඒ/සීඕ/එස්ආර්සී/ඒඩීඑම්/බී/4/2022

බෙදාහැරීම බලන්න

2022 මැයි 01

**අණදෙන නිලධාරීගේ තාවකාලික සංදේශය 12/2022**
**සියලුම පුහුණු වන නාවිකයින් පොදු භෝජනාගාරය භාවිතා කිරීමේදී හා පොදු භෝජනාගාරය වෙත ගමන් කිරීමේදී පිලිපැදිය යුතු කරුණු**

1. පුහුණු වන නාවිකයින් ආහාර ගැනීම සඳහා පොදු භෝජනාගාරය වෙත පැමිණීමේදී හෝ පිටව යාමේදී පසුපස ගේට්ටුව(White Gate) වෙතින් එනම් කාන්තා නාවික නිවාසය ඉදිරි පසින් පැමිණ පොදු භෝජනාගාරයේ ප්‍රධාන දොරටුවෙන් ඇතුලු වීමට වගබලා ගත යුතුයි.

2. පොදු භෝජනාගාරය වෙත ආහාර ගැනීම සඳහා ගමන් කිරීමේදී හා ආහාර ගැනීමෙන් අනතුරුව තම නිවාසය වෙත නැවත පැමිණීමේදී සෑම පුහුණු වන නාවිකයෙකුම අංශයක් වශයෙන් ගමන් කිරීමට වග බලා ගත යුතුය.

3. ආහාර ගැනීම සඳහා පොදු භෝජනාගාරය වෙත පැමිණීමේදී සහ පිටවයාමේදී තම අංශයේ සියළුම නාවිකයින් සමග පැමිණීම හා නැවත නිවාසය වෙත පිටව යාමේදී තම අංශයේ නාවිකයින් සමග පමණක් ගමන් කල යුතු අතර වෙනත් අංශ වල නාවිකයින් සමග ගමන් නොකල යුතුයි.

4. පුහුණු වන නාවිකයින් නිතර නිතර දෝෂ දර්ශනයට ලක්වීම හා අංශයක් ලෙස ප්‍රධාන මාර්ගයේ ගමන් කිරීමේදී එක් පසකින් ගමන් කිරීමට වග බලා ගත යුතුය.

5. නියමිත වේලාවන් වලදී පමණක් පොදු භෝජනාගාරයෙන් ආහාර ලබා ගත යුතු අතර අනෙකුත් වේලාවන් වලදී පොදු භෝජනාගාරය භාවිතා නොකල යුතුය.

6. විනය රාජකාරියෙහි යොදවා ඇති ජ්‍යෝෂ්ඨ නාවිකයින් මින් ඉදිරියට පුහුණු වන නාවිකයින් පොදු භෝජනාගාරය භාවිතා කිරීමේදී විනය විරෝධි ක්‍රියාවන් සිදුකරනු ලැබුවහොත් එම පුහුණු වන නාවිකයින් හට විනයානුකූලව කටයුතු කිරීම සඳහා යොමු කිරීමට වග බලා ගත යුතුය.

7. පාසල් භාර ප්‍රධාන උපදේශකවරුන් සහ ජ්‍යෝෂ්ඨ හා කණිෂ්ඨ උපදේශකවරුන් තමා යටතේ සිටින පුහුණුවන නාවිකයින් ඉහත කරුණු පිලිබඳව දැනුවත් කර එම පුහුණු වන නාවිකයින් ක්‍රියා කරන්නේද යන්න සොයා බැලිය යුතුය.

එස්සී අන්නතුගොඩ, ආර්එස්පී**
කපිතාන් (අවි)
අණදෙන නිලධාරී

බෙදාහැරීම: සම්පූර්ණ (අභ්‍යන්තර)